## 2.32 සාම්ප්‍රදායික ග්‍රාමීය කර්මාන්තයේ නූතන ප්‍රවනතා

ඩබ්. වී. ඩබ්. ජී. වනිගනෙත්ති, බී. ඒ. යූ. නිමලවීර, ඩබ්ලිව් ඒ. එන්. පෙරේරා,
එස්. ආර්. එල්. එස්. රත්නසේකර
භූගෝල විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

---

## ABSTRACT

නිෂ්පාදනය හා අලෙවිය පදනම් කරගෙන ආර්ථික කටයුතු ප්‍රාදේශීය වශයෙන් විශේෂීකරණයකට ලක්ව ඇත. එසේම එම ආර්ථික කටයුතු එම ප්‍රදේශයන්හි භූගෝලීය සාධක, ඓතිහාසික හේතු, සම්ප්‍රදායික තත්ත්වයන්, රාජ්‍ය ප්‍රතිපත්ති ආදිය නිසා ප්‍රාදේශීය වශයෙන් සුවිශේෂිත්වයක් පෙන්නුම් කරයි. වේවැල්දෙණිය ප්‍රදේශයේ වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය සම්බන්ධ ප්‍රාදේශීය විශේෂීකරණයක් හිමිකරගෙන ඇති අතර එය වර්තමානය වන විට විවිධ ප්‍රවණතාවන්ට ලක්ව ඇති ආර්ථික කටයුත්තකි. මෙම අධ්‍යයනයේ අරමුණු වන්නේ එම වෙනස්කම් මෙන්ම ග්‍රමීය කර්මාන්ත සඳහා බලපා ඇති ආර්ථික සමාජීය හේතු සාධක මත ඇති වී තිබෙන ප්‍රවනතා මොනවාද යන්න හඳුනාගැනීමයි.

මේ සඳහා මීරිගම ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ වේවැල් කර්මාන්තය සිදුකරන රදාවඩුන්න, රදාවඩුන්න පහළ හා රදාවඩුන්න මධ්‍යම යන ග්‍රාමනිළධාරී කොට්ඨාශයන්හි වේවැල් නිෂ්පාදනය හා අලෙවි කටයුතු වල නියැලි පවුල් ඒකක 45 ක් සරල සසම්භාවී නියැදි ක්‍රමය යටතේ නියැදිය වශයෙන් තෝරාගනු ලැබිණි. ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්චා ක්‍රමය යටතේ ප්‍රාථමික දත්ත ද වේවැල් කර්මාන්තය පිළිබඳ ග්‍රන්ථ, ප්‍රකාශන වාර්තා මගින් ද ද්විතියික දත්ත ද රැස්කරගනු ලැබුණි.

මෙම අධ්‍යයනයේදී වේවැල් භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය විශාල වශයෙන් ආනයනය කිරීමෙන් නිෂ්පාදන ද්‍රව්‍ය වල මිල මට්ටම් ඉහළ යාම නිසා මහා පරිමාණ වේවැල් නිෂ්පාදනයට යොමු වීම පහළ බැසීමක් සිදුවී ඇත.

වේවැල් කර්මාන්තයේ නියුතු පුද්ගලයන්ට ස්ථාවර ආදායමක් නොමැති වීම නිසා වෙනත් රැකියා අංශ කරා යොමු වීම නිෂ්පාදනයෙහි අමුද්‍රව්‍ය වශයෙන් වේවැල් යොදාගැනීමට අමතරව වානේ, ප්ලාස්ටික්, වීදුරු වැනි ද්‍රව්‍ය භාවිතය ඉහළ ගොස් ඇත.

**මූලික පදඃ-** ප්‍රාදේශීය ආර්ථික කටයුතු, වේවැල් කර්මාන්තය